| |
|---|
| සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟ - 2024 (කලාප) |
| අපේක්ෂකයාගේ නම :- |
| ................................................................................................................................ |
| (මුලකුරු සමග නම) |
| පාසලේ නම හා ලිපිනය :- |
| ................................................................................................................................ |
| ................................................................................................................................ |
| පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි |
| කලාපය :- ................................................................................................................ |

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

**6 ශ්‍රේණිය**
**කාලය පැය 02 යි.**

- **I කොටසින් එකක් ද, II කොටසේ (අ) යටතේ එකක් ද, (ආ) යටතේ එකක් ද, (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

I කොටස

01. පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) ජන සාහිත්‍යයේ වටිනාකම
(ආ) පරිසරයට ආදරය කරමු
(ඇ) මා කැමතිම ජාතික වීරයා
(ඈ) පොත් කියවමු දැනුම ලබමු
(ලකුණු40)

II කොටස

(අ) කොටසින් එක ප්‍රශ්නයක් ද, (ආ) කොටසින් එක ප්‍රශ්නයක් ද, (ඉ) කොටසින එක ප්‍රශ්නයක් ද තෝරාගෙන ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

(අ)

(I) අවුරුදු නිවාඩුව ගමේ තම නිවසේ ගත කිරීමට එන ලෙස නගරයේ මිතුරෙකුට/මිතුරියකට යවන ලිපියක් ලියන්න.

(II) පාසලේ බාලදක්ෂ කණ්ඩායමේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලුම්පතක් සකස් කරන්න.

(ලකුණු 20)

(ආ)

(I) වෙසක් පොහෝදින සැමරුම් උත්සවයක් පැවැත්වීමට කටයුතු සූදනම් කර ඇත.මේ පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිලියෙල කරන්න.

(II) පාසල් ක්‍රීඩා උත්සවය වෙනුවෙන් පාසලේ සංවිධානය කරන ලද උත්සවය පිළිබඳ පුවත්පතකට යැවීමට සුදුසු වාර්තාවක් ලියන්න.
(ලකුණු 20)

(ඉ)

(I) විදුහලෙන් මාරු වී ගිය ඔබේ සිත් ගත් ගුරුතුමාට/ ගුරුතුමියට උපන්දිනයට යවන සුභ පැතුම්පතක් නිර්මාණය කරන්න.

(II) ඩෙංගු උවදුරෙන් බේරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටරයක් සකස් කරන්න

(ලකුණු 20)